# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2456/41 - 2025 ඔක්තෝබර් මස 01 වැනි බදාදා - 2025.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**විධාන අංක 95**

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

10(1) ආ (ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) ආ (ii) වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වෙළෙන්දෙකු විසින් භාණ්ඩ විකුණනු ලබන අවස්ථාවේ දී පහත සඳහන් අමුද්‍රව්‍යවලින් සාදන ලද බහාලුම් මලු කිසිදු පාරිභෝගිකයෙකු වෙත නොමිලේ ලබා දීම නොකළ යුතු බවට ද ඒ සඳහා අය කරනු ලබන මුදල බිල්පතෙහි සඳහන් කළයුතු බවට ද මෙයින් විධාන කරනු ලැබේ.

අඩු ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් (LDPE) - Low-Density Polyethylene

රේඛීය අඩු ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් (LLDPE) - (Linear Low-Density Polyethylene

ඉහත සඳහන් කරන ලද, බහාලුම් මලු සඳහා අයකරනු ලබන මිල, ස්වකීය ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළයුතු බව ද මෙයින් විධාන කරනු ලැබේ.

**අර්ථ නිරූපණය**

**බහාලුම් මලු යන්නෙන් ‘සිලි සිලි බෑග්’ වශයෙන් පොදුවේ හඳුන්වනු ලබන මිලදී ගත් භාණ්ඩ රැගෙනයාමේ කාර්ය සඳහා භාවිතා කරන අතළු සහිත කුමන හෝ පරිමාණයෙන් යුතු මලු යන්න අදහස් වේ.**

(මධ්‍යම පරිසර අධිකාරිය)

මෙම විධානය වර්ෂ 2025 නොවැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**හේමන්ත සමරකෝන්,**
සභාපති.

2025 ඔක්තෝබර් 01 වැනි දින,
කොළඹ දීය.

EOG 10 - 0010

1A - PG 7272 — 54 (2025/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.